සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

**නම/විභාග අංකය :- ......................................................... කාලය: පැය එකයි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පතයේ **(x)** ලකුණ යොදන්න.

(01) සන්නිවේදන ක්‍රියාවලියේ මූලාරම්භය වන්නේ,

1) සන්නිවේදකයා ය. 2) ග්‍රාහකයා ය. 3) පණිවිඩය ය. 4) ප්‍රතිචාරය ය.

(02) විවිධ ජාතීන්ට අයත් පුද්ගලයන් තමන්ට ආවේණික වූ ඇඳුම් පැළඳුම් භාවිත කිරීම තුළින් සිදුවන්නේ,

1) ශ්‍රව්‍ය සන්නිවේදනය යි. 3) අවාචික සන්නිවේදනය යි.
2) වාචික සන්නිවේදනය යි. 4) අවිධිමත් සන්නිවේදනය යි.

(03) සන්නිවේදන බාධක පිළිබඳව මුලින්ම හඳුන්වා දුන්නේ,

1) ලැස්වෙල් ආකෘතියෙනි. 3) ෂැනොන් වීවර් ආකෘතියෙනි.
2) ලැස්වෙල් අර්ථකථනයෙනි. 4) වීවර් අර්ථකථනයෙනි.

(04) ශ්‍රී ලංකාවේ මුල්ම පුවත්පත වන්නේ

1) වීරකේසරී 2) කලම්බු ජර්නල් 3) ලංකාලෝකය 4) ලක්මිණි පහන

(05) මුද්‍රිත සටහනක් පෙර සූදානමකින් තොරව ඒ අවස්ථාවේදී ම ශාල පිරිසකට ප්‍රදර්ශනය කළ හැක්කේ,

1) පිටුපෙරලනය 3) ක්ෂණික ප්‍රක්ෂේපණය
2) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය 4) කදා ප්‍රක්ෂේපණය

(06) තම ගමේ පවතින අඩුපාඩුවක් පිළිබඳ හෙළිදරව් කිරීමට පුවත්පතකට ලිපියක් යොමු කළ යුත්තේ,

1) විශේෂාංග සංස්කාරකට ය. 3) ප්‍රාදේශීය සංස්කාරකට ය.
2) දැන්වීම් සංස්කාරකට ය. 4) ප්‍රධාන කතෘට ය.

(07) පිටපත් 500ක් අවශ්‍ය වූ ප්‍රශ්න පත්‍රයක් කෙටි කාලයක් තුළ මුද්‍රණය කර ගැනීමට ඔබ යෝජනා කරන්නේ,

1) සමතල මුද්‍රණයකි 3) අංකිත මුද්‍රණයකි
2) උත්තල මුද්‍රණයකි 4) ඡායා පිටපත් මුද්‍රණයකි

(08) නිමල්ට ලැබුණු ෆැක්ස් පණිවිඩයේ තීන්ත බොඳ වීම නිසා එය නිසියාකාරව කියවා ගැනීමට නොහැකි විය. සන්නිවේදන බාධක වලට අනුව මෙය,

1) අර්ථ බාධාවකි. 2) මාධ්‍ය බාධාවකි. 3) දෘශ්‍ය බාධාවකි . 4) කායික බාධාවකි.

(09) නිවසකට ඇතුලුවීමට උත්සාහ කළ සොරකු බල්ලෙකු බිරීම නිසා ගෙහිමියාට හඳුනා ගැනීමට ඉවහල් වූ සන්නිවේදන ස්වරූපවල අනුපිලිවෙල වන්නේ,

1) ශ්‍රව්‍ය හා අවිධිමත් සන්නිවේදනය යි.
2) වාචික හා නිර්වාචික සන්නිවේදනය යි.
3) ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය යි.
4) විධිමත් හා වාචික සන්නිවේදනය යි.

(10) ජන සන්නිවේදනයේ විශේෂත්වයක් **නොවන්නේ,**

1) සංවිධානමය ව්‍යුහයක් සහිත වීම යි.
2) ඒක මාර්ගික වීම යි.
3) ප්‍රතිචාර ඒ අවස්ථාවේදීම ලැබීම යි.
4) සන්නිවේදක- ග්‍රාහක භූමිකා හුවමාරු නොවීම යි.

(11) පරිගණකය මගින් ලේඛන සැකසීමේ දී යොදා ගන්නා මෘදුකාංගයක් නොවන්නේ,

1) මයික්‍රොසොෆ්ට් වර්ඩ්
2) ඇඩෝබි ඉන්ඩිසයින්
3) මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට්
4) ඇඩෝබි පේජ්මේකර්

(12) 'බලපෑම' යන සන්නිවේදන මූලිකාංගය හඳුන්වා දුන් සන්නිවේදන ආකෘතිය වන්නේ,

1) ෂැනොන් වීවර් ආකෘතිය
2) ලැස්වෙල් ආකෘතිය
3) ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය
4) බර්ලෝ ආකෘතිය

(13) අවාචික සන්නිවේදනයේ සාමාජීය සාධකයක් **වන්නේ,**

1) මුහුණේ ඉරියව් හා අංග චලන.
2) විදුහල්පතිතුමාගේ කාමරය.
3) ඇඳුම් පැළඳුම්.
4) මව හා දියණිය අතර දුර.

(14) පුවත්පතක ලුහුඬු දැන්වීම් සඳහා ගාස්තු අය කරනු ලබන්නේ,

1) ඉඩ ප්‍රමාණයට ය.
2) වචන ප්‍රමාණයට ය.
3) වර්ණවත් භාවයට ය.
4) අකුරු ප්‍රමාණයට ය.

(15) ආයතනයක් තුළ අවිධිමත් සන්නිවේදනය පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන විට දී භාවිත කළ **නොහැකි** ක්‍රමයක් වන්නේ,

1) අංශ රැස්වීම්. 2) අභ්‍යන්තර ලිපි. 3) යෝජනා පෙට්ටි. 4) කමිටු රැස්වීම්.

(16) සමූහ සන්නිවේදනයට සාපේක්ෂව අන්තර් පුද්ගල සන්නිවේදනයේ කැපී පෙනෙන ලක්‍ෂණයක් වන්නේ,

1) පුද්ගලයන් කිහිපදෙනෙක් සහභාගි වීමයි.
2) තාක්‍ෂණික මෙවලම් භාවිත කිරීමයි.
3) නිර්වාචික සන්නිවේදනය ප්‍රබල වීමයි.
4) ප්‍රදීපාගාර උපක්‍රමය භාවිතයයි.

(17) සමාජානුයෝජනය හා සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම.

1) සන්නිවේදන කාර්යයකි.
2) සන්නිවේදන ලක්‍ෂණයකි.
3) සන්නිවේදන ස්වරූපයකි.
4) සාමාජීය කාර්යයකි.

(18) ඔබ ප්‍රදේශයේ මාර්ගය නඩත්තු කටයුතු සිදු කරන නිසා පාර වසා තබන බව දැන්වීමට සුදුසුම ක්‍රමය වන්නේ,

1) ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම
2) ගුවන් විදුලි ප්‍රචාරණ දැන්වීමක් පළ කිරීම
3) කෙටි පණිවිඩ(SMS) යැවීම
4) දැන්වීමක් ප්‍රදර්ශනය

(19) පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මාධ්‍ය උපකරණ භාවිත කිරීම මගින් අපේක්‍ෂා **නොකරන්නේ,**

1) ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සක්‍රීය සබඳතාවක් ඇති කිරීම.
2) කාලය කළමනාකරණය කළ හැකි ය.
3) යමක් පැහැදිලිව අවබෝධ කරවිය හැකි ය.
4) ගුරුවරයා ඉගැන්වීමේ කාර්යයෙන් නිදහස් කිරීම ය.

(20) අන්තර් පුද්ගල සන්නිවේදනයේ අරමුණක් **නොවන්නේ,**

1) දුක සැප බෙදා ගැනීම. 2) ඉගැන්වීම.
3) මාර්ගෝපදේශනය. 4) විනෝදාස්වාදය.

(21) වෙළඳ දැන්වීම්වලට ආකර්ෂණීය ජායාරූප ඇතුළත් කිරීමේ එක් අරමුණක් වන්නේ,

1) නව පාරිභෝගික පිරිසක් බිහි කිරීම.
2) ව්‍යාපාරිකයන්ගේ හොඳ හිත දිනා ගැනීම.
3) මෝස්තර නිරූපණ ශිල්පීන්ට ප්‍රසිද්ධියක් ලබා දීම.
4) ජායාරූප ශිල්පීන්ට මූල්‍ය වාසි ඇති කර දීම.

(22) මේ අතුරින් ද්වි මාර්ගික සන්නිවේදනයක් නොවන්නේ

1) පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය. 3) ධර්ම සාකච්ඡා අවස්ථාව.
2) රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශය. 4) මව හා පියා අතර සංවාදයකදී ය.

(23) පහත දැක්වෙන අවස්ථා අයත් වන සන්නිවේදන ස්වරූප කාණ්ඩය වන්නේ,

- රාජ්‍ය නායකයෙකු මියගිය විට ජාතික ධජය අඩකුඹු කිරීම.
- අවමංගල්‍යයක දී සුදු කොඩි දැමීම.
- ඉහළ නිලධාරියෙක් පහළ කාර්යය මණ්ඩලයට උපදෙස් දීම.
- ගිලන්රථ නලාව.

1) දෘශ්‍ය , අවාචික , ශ්‍රව්‍ය , අවිධිමත්. 3) අවාචික හා විධිමත් , ශ්‍රව්‍ය.
2) ශ්‍රව්‍ය , දෘශ්‍ය , වාචික , විධිමත්. 4) දෘශ්‍ය , අවාචික , විධිමත්, ශ්‍රව්‍ය.

(24) පරිගණක මුද්‍රණ ක්‍රියාවලිය මගින් කලු සුදු පිටපතක් ලබා ගැනීමට තෝරා ගත යුත්තේ,

1) ලේසර් මුද්‍රණ යන්ත්‍රය. 3) ඩොට් මුද්‍රණ යන්ත්‍රය.
2) ඉන්ක්ජෙට් මුද්‍රණ යන්ත්‍රය. 4) ඉහත සියල්ලම.

(25) සේයා පටලයක අඩංගු රසායනික මිශ්‍රණය වන්නේ,

1) ලවණ මිශ්‍රණයකි. 3) රිදී ලෝහය ලවණ සමග එකතු වූ මිශ්‍රණයකි.
2) රත්‍රන් මිශ්‍රණයකි. 4) තුත්තනාගම් මිශ්‍රණයකි.

(26) ශ්‍රී ලංකාවට ගුවන් විදුලිය හඳුන්වා දීමට පුරෝගාමී වූයේ,

1) ඉංග්‍රීසි ජාතිකයන් ය. 3) පෘතුග්‍රීසි ජාතිකයන් ය.
2) ලන්දේසි ජාතිකයන් ය. 4) ඉන්දියානු ජාතිකයන් ය.

- ප්‍රශ්න අංක 27 සිට 31 දක්වා පහත සටහන ඇසුරින් පිලිතුරු සපයන්න

| | |
|---|---|
| A – තොරතුරු මූලාශ්‍රය / සන්නිවේදකයා | E - ග්‍රාහකයා |
| B - පණිවිඩය | F – බලපෑම |
| C- මාධ්‍ය | G - ප්‍රතිපෝෂණ |
| D - බාධා | |

(27) ඉහත අංග අතුරින් ලැස්වෙල් ආකෘතියට අයත් අංග අනුපිලිවෙලින් වන්නේ,

1) A , B , C , D , E 2) A , C , E , F, B 3) A , B , C , E , F 4) G , F , E , D , A

(28) දෙව්මිණිට සුමලි දුන් දුරකථන පණිවිඩය නිසි ලෙස අවබෝධ කර ගත නොහැකි වූයේ සුමලි මිශ්‍ර භාෂාවක් මගින් පණිවිඩය ලබා දුන් නිසාය. ඉහත අංග අතුරින් එය නිරූපණය වන්නේ,

1) B මගිනි. 2) D මගිනි. 3) G මගිනි. 4) F මගිනි.

(29) දෙව්මිණි හා සුමලි දෙදෙනාගේ සංවාදය ද්වි මාර්ගිකව නිරූපණය වන්නේ,

1) A,B,C,D,E මගිනි. 2) A,B,D ,E,F මගිනි. 3) A,B,C,E,F,G මගිනි. 4) A,C,E,F,G මගිනි

(30) පණිවිඩය ග්‍රහණය කර ගන්නා හා පණිවිඩය ලබා දෙන්නා හඳුනාගත හැක්කේ,

1) A හා C මගිනි. 2) A හා E මගිනි. 3) E හා A මගිනි. 4) E හා F මගිනි.

(31) සුමලි දෙව්මිණිට දුන් පණිවිඩය නිසා ඇයට සතුටක් ඇති වූ බව හැසිරීමෙන් දක්නට ලැබුණි. සන්නිවේදන ක්‍රියාවලියක් මගින් ග්‍රාහකයා තුළ ඇතිවන චර්යාමය වෙනස හඳුන්වන්නේ,

1) G ලෙස ය. 2) E ලෙස ය. 3) F ලෙස ය. 4) D ලෙස ය.

(32) නිර්මාණාත්මක චින්තනය මගින් නිර්මාණයක් කිරීමේ දී තිබිය යුතු අංගයක් **නොවන්නේ,**

1) අපූර්වත්වයයි.
2) නව්‍යත්වයයි.
3) පරිකල්පනයයි.
4) හරසුන් වින්දනයයි.

(33) පුරවැසියෙකුගේ ලක්ෂණයක් නොවන්නේ,

1) බදු ගෙවීම.
2) නීතිගරුක වීම.
3) ගැටුම් ඇතිකර නොගැනීම.
4) ප්‍රජාතන්ත්‍රවාදී නොවීම.

(34) මේ අතුරින් මානව ධර්මතාවක් **නොවන්නේ,**

1) මෛත්‍රිය. 2) කරුණාව. 3) ක්‍රෝධය. 4) ඉවසීම.

(35) ජනමාධ්‍ය මානවවාදී අරමුණුවලින් බැහැර වී සෑම විටම වාණිජවාදී අරමුණුවලින් සංතෘප්ත වන්නේ,

1) එමගින් යහපත් සමාජ කාර්යයන් සිදුවන නිසා ය.
2) රජයේ නියමයන් නිසා ය.
3) ආයතනික ප්‍රතිපත්ති නිසා ය.
4) ආයතනය පවත්වා ගෙන යාමට අවශ්‍ය පිරිවැය ලබා ගැනීමට ය.

(36) රටක මාධ්‍ය වාරණය අවම නම් එහි අර්ථය වන්නේ,

1) එම රටේ දොරටුපාලක සංකල්පය හොඳින් ක්‍රියාත්මක වීමයි.
2) එම රටේ මාධ්‍ය නිදහස උපරිමයෙන් ක්‍රියාත්මක වන බවයි
3) මාධ්‍යවේදීන් රජය විසින් බියවද්දා ඇති බවයි.
4) මාධ්‍ය නීතිය දැඩිව ක්‍රියාත්මක වන බවයි.

(37) ඡායාරූපයක් විශාලනය කිරීමේ දී එම ඡායාරූපයේ,

1) ගහණතාව පිළිබඳ දැනගෙන තිබිය යුතු ය.
2) කැමරා කාචය පිළිබඳ දැනගෙන තිබිය යුතු ය.
3) ක්ෂෙත්‍ර ගැඹුර පිළිබඳ දැනගෙන තිබිය යුතු ය.
4) පටල වේගය පිළිබඳ දැනගෙන තිබිය යුතු ය.

(38) පහත දැක්වෙන අවස්ථා ඡායාරූපගත කිරීමට ඔබ යොදා ගන්නා කැමරා කාච වර්ග කාණ්ඩය අනු පිළිවෙලින් දැක්වෙන්නේ,

A - විවිධ ප්‍රසංගයක නර්තනයේ යෙදෙන නර්තන කණ්ඩායම
B - ඈත මුහුදේ පාවෙන නෞකාව
C - නර්තන ශිල්පිණියගේ මුහුණේ සිනහව
D - අයිස්ක්‍රීම් කන ළමයා

1) සාමාන්‍ය කාචය , දුර රූප කාචය , පුළුල් කෝණ කාචය , යුහුඹු කාචය.
2) පුළුල් කෝණ කාචය , දුර රූප කාචය , යුහුඹු කාචය , සාමාන්‍ය කාචය.
3) දුර රූප කාචය , සාමාන්‍ය කාචය , යුහුඹු කාචය , පුළුල් කෝණ කාචය.
4) පුළුල් කෝණ කාචය , යුහුඹු කාචය , දුර රූප කාචය , සාමාන්‍ය කාචය.

(39) **සාවද්‍ය** ප්‍රකාශය සහිත වරණය තෝරන්න.

1) ජනමාධ්‍ය තොරතුරුවල ස්වභාවය දෛනිකත්වය යි.

2) ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති ඡායාරූප පමණක් ජනමාධ්‍යවල සෑමවිටම පළ වේ.

3) සෑම සන්නිවේදන වර්ගයක දී ම තාක්‍ෂණික මෙවලම් භාවිත කරයි.

4) කාචයේ නාභීය දුර වැඩිවන විට ක්‍ෂෙත්‍ර ගැඹුර අඩු වේ.

(40) පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය යන මාධ්‍යයන් හි ග්‍රාහකයා හඳුන්වන අනුපිළිවෙල වන්නේ,

1) ශ්‍රාවකයා , පාඨකයා , ප්‍රේක්‍ෂකයා.

2) පාඨකයා , ශ්‍රාවකයා , ප්‍රේක්‍ෂකයා.

3) ප්‍රේක්‍ෂකයා , ශ්‍රාවකයා , පාඨකයා.

4) පාඨකයා , ප්‍රේක්‍ෂකයා, ශ්‍රාවකයා.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය දෙකයි.**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් සෑම ප්‍රශ්නයකට ම මුළු ලකුණු 10 බැගින් හිමි වේ.**

(01) මේ දිනවල රටපැතිර යන කොවිඩ්-19 වසංගතය වෙනුවෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ඔබේ පාසලේ පැවැත්වීමට නියමිතව ඇති අතර එහි දේශකයා ලෙස ඔබ ප්‍රදේශය භාර ප්‍රධාන වෛද්‍ය නිලධාරිතුමා පැමිණීමට නියමිත යැයි සිතන්න.

1) මෙහි පැහැදිලිව ම පෙනෙන සන්නිවේදන **වර්ගය** නම් කරන්න. (ලකුණු 2)

2) මෙහිදී දේශකයාට භාවිත කළ හැකි **අවාචික** සන්නිවේදන ක්‍රම 2 ලියා දක්වන්න. (ලකුණු 1×2=2)

3) මෙහිදී දේශකයාට භාවිත කළ හැකි වඩාත් උචිත ප්‍රක්ෂේපණ උපකරණය කුමක්ද? (ලකුණු 2)

4) එය භාවිතයෙන් දේශනයට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න. (ලකුණු 1×2 = 2)

5) මෙම දේශනය පිළිබඳ පණිවිඩය මුද්‍රිත මාධ්‍යයක් මගින් ප්‍රචාරය කරන්නේ නම් එහි ප්‍රධාන වශයෙන් ඇතුළත් විය යුතු අංග මොනවාද? (ලකුණු 2)

6) මෙම දේශනයේ දී සිදුවිය හැකි අර්ථ බාධාවක් හා මාධ්‍ය බාධාවක් සඳහන් කරන්න. (ලකුණු 1×2=2)

7) දේශනය ඇමතීමේ දී දේශකයා අනුගමනය කළ යුතු උපාය මාර්ග දෙකක් ලියා දකවන්න. (ලකුණු 1×2 = 2)

8) මෙහිදී දේශකයා මූලික වශයෙන් භාවිත කරන සන්නිවේදන ස්වරූපයක් දක්වා ඊට අදාළ නිපුණතාවක් ලියා දක්වන්න. (ලකුණු 1×2 = 2)

9) මෙහිදී දේශකයාට ප්‍රතිපෝෂණ ලබා දීමට ඔබ යෝජනා කරන ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 1×2 = 2)

10) පාසල් මාධ්‍ය ඒකකය මගින් කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා සිසුන් දැනුවත් කළ හැකි සන්නිවේදන ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 1×2 = 2)

(02) 1) ලැස්වෙල් නිර්වචනය ලියා දක්වන්න. (ලකුණු 1)

2) සන්නිවේදන අරමුණු හතර නම් කරන්න. (ලකුණු 1/2×4 = 2)

3) සන්නිවේදන ක්‍රියාවලිය ද්වි මාර්ගික වීමේ වාසි තුනක් පහදන්න. (ලකුණු 1×3 = 3)

4) ජන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 1×4 = 4)

(03) 1) **සංජානනය** යනු කුමක්ද? (ලකුණු 1)

2) සංදේශයක් දොරටුපාල ක්‍රියාවලියට හසුවීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 1×2 = 2)

3) ජනමාධ්‍ය පරිහරණය කිරීමේ දී පාසල් සිසුවකු ලෙස සැලකිය යුතු කරුණු තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 1×3 = 3)

4) දොරටුපාල සංකල්පය නිසා ග්‍රාහකයාට ලැබෙන වාසි දෙකක් හා අවාසි දෙකක් විස්තර කරන්න. (ලකුණු 1×4 = 4)

(04) 1) තමා සමග සන්නිවේදනය කිරීමේ දී භාවිත කරන නාලිකා මොනවාද? (ලකුණු 1)

2) යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයේ දී භාවිත කළ හැකි තාක්‍ෂණික මෙවලම් දෙකක් නම් කරන්න. (ලකුණු 1×2 = 2)

3) ඡායාරූප ශිල්පියෙකු සතු විය යුතු ආචාර ධර්ම තුනක් විස්තර කරන්න. (ලකුණු 1×3 = 3)

4) මුද්‍රිත මාධ්‍ය සඳහා ඡායාරූප භාවිත කිරීමේ වැදගත්කම් හතරක් පහදන්න. (ලකුණු 1×4 = 4)

(05) 1) ඵලදායි ලේඛනයක දක්නට ලැබෙන ලක්‍ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 1/2×2 = 1)

2) අභිසාරී මාධ්‍ය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

3) අවිධිමත් සන්නිවේදනයේ දක්නට ලැබෙන ලක්‍ෂණ තුනක් පහදන්න. (ලකුණු 1×3 = 3)

4) පුද්ගල රසඥතාව වර්ධනය කිරීමට ජනමාධ්‍යයේ කාර්යභාර්ය කෙබඳු වේදැයි නිදසුන් මගින් පහදන්න. (ලකුණු 4)

(06) කුමුදුට ලැබුණු රැකියා ඉල්ලුම් පත්‍රය පුරවා පරිගණකය මගින් ම රැකියා ආයතනයට යැවීමට අවශ්‍ය විය.

1) ඒ සඳහා ඇයට යොදාගත හැකි සුදුසුම තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණය කුමක්ද? (ලකුණු 1)

2) රැකියා අයදුම්පත්‍රය ආයතනයට ලැබුණු පසු එය භාරගත් නිලධාරියා කළ යුතු කාර්යයන් අනුපිළිවෙලින් ලියන්න. (ලකුණු 2)

3) දුරකථන සංවාදයක් මගින් කුමුදු සම්මුඛ පරීක්ෂණයට භාජනය කළේය. දුරකථන සංවාදයක දී පිළිපැදිය යුතු ආචාර ධර්ම තුනක් පහදන්න. (ලකුණු 1×3 = 3)

4) කාර්යාලීය මාධ්‍ය උපකරණ හතරක් නම් කොට එහි කාර්යභාරය වෙන වෙනම ලියා දක්වන්න.

(නම් කිරීමට 1/2×4=2)
(කාර්යභාරයට 1/2×4=2)

(07) 1) ජනමාධ්‍ය බෙදා දක්වන ප්‍රභේද දෙක නම් කර නිදසුන් එක බැගින් සපයන්න. (ලකුණු 1/2×2=1)

2) පුවත්පත් ආයතනයක ප්‍රධාන තනතුර නම් කර ඔහුට අයත් කාර්යයක් නම් කරන්න. (ලකුණු 1×2=2)

3) ජනමාධ්‍ය ආයතනයක් තම වාණිජ අරමුණු ඉටුකර ගැනීමට භාවිත කරන උපක්‍රම දෙකක් විස්තර කරන්න. (ලකුණු 1 1/2×2=3)

4) මාධ්‍ය ක්‍රියාකාරිත්ව කෙරෙහි රජයේ ඍජු හා වක්‍ර මැදිහත්වීම් දෙක බැගින් වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 1×4=4)